# අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පිරවීම

**අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු හතක (07) පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.**

**1. සුදුසුකම්**

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දින වන විට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබීමට, අංක 1225/32 හා 2002.03.01 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා පූර්ව සේවා ව්‍යවස්ථාවේ හෝ අංක 1928/28 හා 2015.08.21 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ හෝ අංක 2141/6 හා 2019.09.16 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා දෙවන සංශෝධනයේ විධිවිධාන අනුව සුදුසුකම් ලබා ඇති , ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු වීම.

**2. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

I. මේ සමඟ දක්වා ඇති ආකෘතිය ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසි වල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, **2020.07.07** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් $2x2^{1}/_{2}$ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

III. ලියාපදිංචි තැපැලට යොමු කිරීමට ප්‍රථම සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පතේ ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළයුතු වේ.

E-mail = eseas.moe@gmail.com
Subject = Calling application for the post of Director of Education
(NAME & ID No)

**3. ක්‍රමවේදය**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් කරනු ලබන නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ.

**4. අවධානයට**

අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු දෙකක පුරප්පාඩු පිරවීම සඳහා 2020.02.07 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකරන කරන ලද නිවේදනයට අනුව අයදුම්පත් යොමුකරන ලද නිලධාරීන් නැවත මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර එම අයදුම්පත් ද ඉදිරි සම්මුඛ පරීක්ෂණයේදී අදාල කර ගන්නා බවද කාරුණිකව දන්වා සිටිමි.

**එන්.එච්.එම්. චිත්‍රානන්ද**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
2020.06.23